ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone

ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone

දෙවන වාර ඇගයීම 2025
Second Term Evaluation - 2025

| | | | | | |
|---|---|---|---|---|---|
| ශ්‍රේණිය Grade | 6 | විෂයය Subject | බුද්ධ ධර්මය | කාලය Time | පැය 02 |

1 කොටස

- පළමු කොටසෙහි ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

1. "ලෝ සතුන් සසර දුකින් මුදවනු පිණිස ඔබ වහන්සේ බුදු බව ප්‍රාර්ථනා කරමින් දස පාරමී දම් පිරුවා.දැන් පාරමී පුරා අවසානයි. බුදු වන්නට කාලය පැමිණ ඇතැයි" යනුවෙන් ආරාධනා කරනු ලැබුයේ,

   i. කාලදේවල තවුසාය　　ii. සහම්පති බ්‍රහ්මයා ප්‍රමුඛ දෙවියන්ය
   iii. භාග්ගව බමුණාය　　iv. ආනන්ද හිමියන්ය

2. මෙයින් අවුරුදු දහසක් ඉකුත් වූ කල බුදු කෙනෙකුන් උපදිනවා යි හඬ නගා කියමින් ඇවිදීම,

   i. බුද්ධ කෝලාහලයයි　　ii. සම්බුද්ධත්වයයි
   iii. මනුලොව ඉපදීමයි　　iv. අවසාන ඉපදීමයි

3. පංච මහා විලෝකනයට අයත් නොවන්නේ,

   i. කාලය　　ii. දීපය
   iii. පියා　　iv. කුලය

4. සිදුහත් කුමාරෝත්පත්තියත් සමග සිදු වූ අසිරිමත් සිදුවීම්වලට අයත් නොවන්නේ,

   i. සතරවරම් දෙවිවරු සාධුකාර පැවැත්වීම
   ii. අහසින් සිසිල් හා උණුසුම් දිය දහරා මතු වීම
   iii. කුමරු සිංහනාද පැවැත්වීම
   iv. බුදු වීමට සුදුසු පරිසරය පිළිබඳව විමසා බැලීම

5. සිදුහත් කුමරුන් සමග එකට හැදී වැඩුණු කුමාරවරුන් දෙදෙනෙකු වන්නේ,

   i. නන්ද හා කාලුදායි　　ii. යස හා සුභ
   iii. උපතිස්ස හා කෝලිත　　iv. මුගලන් හා කාලුදායි ඇමති

6. පැවිදි වූ බෝසතාණන් වහන්සේ අටවන දිනයේ පිඬු සිගා වඩින ලද්දේ,

   i. දෙව්දහ නුවරටය　　ii. පාවා නුවරටය
   iii. රජගහ නුවරටය　　iv. කොසඹෑ නුවරටය

7. සත්ත්වයාගේ උත්පත්තිය හා මරණය සිදු වන ආකාරය දැකීමේ නුවණ හඳුන්වනුයේ,

   i. ආසවක්ඛය ඥාණය යනුවෙනි.
   ii. පුබ්බේනිවාසානුස්සති ඥාණය යනුවෙනි.
   iii. චුතූපපාත ඥාණය යනුවෙනි.
   iv. දසබල ඥාණය යනුවෙනි.

8. ත්‍රිවිධ රත්නයට අයත් ගුණ ගණන වනුයේ,

i. 20 කි. ii. 24 කි.
iii. 30 කි. iv. 25 කි.

9. සුගන්ධං සීතලං කප්පං පසන්න මධුරං සුභං යනුවෙන් සජ්ඣායනා කරනු ලබන්නේ,

i. ගිලන් පස පූජා කරන ගාථාවයි ii. පැන් පූජා කරන ගාථාවයි
iii. සුවඳ දුම් පූජා කරන ගාථාවයි iv. පහන් පූජා කරන ගාථාවයි

10. භාවනාවක් වැඩීමේදී ශිෂ්‍යාවක සඳහා වඩාත් සුදුසු ඉරියව්ව වනුයේ,

i. අර්ධ පර්යංකයයි ii. බද්ධ පර්යංකයයි
iii. සක්මන් භාවනාවයි iv. මේ කිසිවක් නොවේ

- නිවැරදි පිළිතුර හිස්තැනෙහි ලියන්න.

11. මේ වැලි දෝතේ ප්‍රමාණයට මට ගුරුවරුන්ගෙන් අවවාද ලැබේවා යි ප්‍රාර්ථනා කළේ .......................... ................................. ය.

12. කම්මැලි නොවී ගොවිතැන් වෙළදාම් ආදියද සිල් රැකීම,භාවනා කිරීම ආදිය .................................... .................................. ලෙස හදුන්වයි.

13. සීල ශික්ෂාව .................................... හා ................................. ලෙස දෙයාකාරය.

14. අධාර්මික වූත්,අකුසල වූත්,ජීවිකා වෘත්තියෙන් වෙන් වී කටයුතු කිරීම ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ..................................... ලෙස හදුන්වයි.

15. වරදට පොළඹවන අය ඇසුරට නොගනිමින් සැම විටම චරිතයෙහි පිවිතුරු බව රැකීම යන කරුණ ඇතුළත් පංච සීල පාඨය ..................................................................... ලෙස දක්වා ඇත.

- 16 සිට 20 දක්වා දී ඇති වාක්‍යය නිවැරදි නම් ( ✓ )ලකුණ ද වැරදි නම් ( ✕ ) ලකුණ ද වරහන් තුළ යොදන්න.

16. සිගාලෝවාද සූත්‍රය සිගාලක සූත්‍රය ලෙස ද හදුන්වයි. ( )

17. දෙමාපියන් බ්‍රහ්ම යනුවෙන් හැදින්වෙන්නේ, ඔවුන් තුළ මෙත්තා,කරුණා,මුදිතා,උපේක්ෂා යන ගුණ ධර්මයන් ඇති හෙයිනි. ( )

18. මඝ මානවක නිවැරදි ක්‍රියා කළ ප්‍රියමනාප සමාජශීලි තරුණයෙක් විය. ( )

19. ජාතික කොඩියට අයත් තද රතු පාටින් ශ්‍රී ලාංකික ජනතාවගේ ජීව රුධිරය පෙන්නුම් කරයි ( )

20. ජාතික කොඩිය පරිහරණයේදී කිසිදු අවස්ථාවක එය බිම නොතිබිය යුතුය. ( )

(ලකුණු 2 x 20 = 40)

## 11 කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු ලියන්න.**

01. හයවන ශ්‍රේණියේ දෙවන වාරයේ බුද්ධ ධර්මය විෂය සඳහා විෂය භාර ගුරුතුමා හෝ ගුරුතුමිය විසින් ඔබගේ පන්තිය වෙත ලබා දුන් ඇගයීම ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. ඇගයීම් ප්‍රභේදය නම් කරන්න. (ල. 02)
ii. එම ඇගයීම සඳහා යොදාගත් පාඩමේ නම ලියන්න. (ල. 02)
iii. කණ්ඩායමට ලැබුණු ගුරු උපදෙස් දෙකක් නම් කරන්න. (ල. 02)
iv. ඇගයීමේදී ඔබ මුහුණ දුන් ගැටලු දෙකක් ලියන්න. (ල. 02)
v. එම ගැටලු අවම කර ගැනීමට කණ්ඩායම විසින් ගනු ලැබූ පියවර 02 ක් ලියන්න. (ල. 02)
vi. දරුවන්ගෙන් දෙමාපියන්ට ඉටු විය යුතු යුතුකම් 02 ක් ලියන්න. (ල. 02)
vii. දෙමාපියන්ගෙන් දරුවන්ට ඉටු විය යුතු යුතුකම් 02 ක් ලියන්න. (ල. 02)
viii. බොදු දරුවෙකු ලෙස ඔබ තුළ තිබිය යුතු ගුණාංග 02 ක් ලියන්න. (ල. 02)
ix. දෙමාපියන්ට සැලකීමේ ඇති අගය වාක්‍යය 02 කින් ලියන්න.
x. යුතුකම් පිළිබඳව පෙන්වා දෙන සූත්‍රය නම් කරන්න. (ල. 02)

02.

i. " නතං කම්මං කතං සාධු"ගාථාව ලියන්න. (ල. 02)
ii. එම ගාථාවෙහි තේරුම ලියන්න. (ල. 03)
iii. ඔබ සිදු කර ඇති යහපත් ක්‍රියා 05 ක් ලියන්න. (ල. 05)

03.

i. ගිහියාගේ නිත්‍ය සීලය නම් කරන්න. (ල. 02)
ii. ත්‍රිකෝටික පාරිශුද්ධ සීලය නම් කරන්න. (ල. 03)
iii. පන්සිල් පිළිවෙලින් නම් කරන්න. (ල. 05)

04.

i. සම්මා වාචා යන්නෙහි අදහස ලියන්න. (ල. 02)
ii. සම්මා වාචා යන්න සතරාකාරය.ඉන් තුනක් නම් කරන්න. (ල. 03)
iii. සිල්වත්ව කටයුතු කිරීමේ ආනිසංස 05 ක් ලියන්න. (ල. 05)

05.

i. රාහුල කුමරුගේ දෙමාපියන් නම් කරන්න. (ල. 02)
ii. රාහුල කුමරුගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ 03 ක් ලියන්න. (ල. 03)
iii. දියුණුවේ දොරටු 05 ක් නම් කරන්න. (ල. 05)

06.

i. ත්‍රිවිධ චෛත්‍යය අතරින් 02 ක් නම් කරන්න. (ල. 02)
ii. බුද්ධ,ධම්ම,සංඝ යන ත්‍රිවිධ රත්නයෙහි ගුණ ලියන්න (ල. 03)
iii. පන්සලට ගොස් සිදු කරනු ලබන වතාවත් 05 ක් ලියන්න (ල. 05)

07.

පහත සඳහන් මාතෘකා අතරින් 02 කට කෙටි සටහන් ලියන්න.

i. රාහුල පොඩි හාමුදුරුවෝ
ii. පන්සිල් සුරකිමු.
iii. ජාතික කොඩිය
iv. හොඳ නරක හඳුනාගෙන කටයුතු කරමු. (ල. 05 x 2 = 10)